කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

8 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව I , II | කාලය පැය 1 වි 30

නම : ..............................................................................................................

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. යම්කිසි කතාවක් හෝ සිදුවීමක් නාට්‍යයක් බවට පත්කිරිමේදී ප්‍රධාන වන්නේ,
 1. එහි ඇති චරිතය
 2. සිදුවූ ස්ථානයයි
 3. නාට්‍යෝචිත අවස්ථාවයි
 4. කතා නායකයාය

02. නාට්‍යය තේමාව යනුවෙන් අදහස් කරන්නේ,
 1. නාට්‍යයේ සංවාදය වේ
 2. නාට්‍යයෙන් කියවෙන ප්‍රධාන අදහස වේ
 3. අනුෂාංගික අංග විස්තර කිරීමයි
 4. නාට්‍යයේ සංගීතමය අංශයයි

03. සිතින් යමක් සිතාගෙන අපූර්ව දෙයක් නිර්මාණය කිරීම
 1. ස්මෘතියයි
 2. අනුරූපණයයි
 3. පරිකල්පනයයි
 4. නිරීක්ෂණයයි

04. ආංගික අභිනයේදී ශරීරය බෙදෙන ප්‍රභේද වන්නේ,
 1. හිස් දෙපාර්ශවය පාද
 2. අංග , ප්‍රත්‍යංග උපාංග
 3. බෙල්ල උරහිස බාහු
 4. අංග උකුල උරහිස

05. රංග විධාන අවශ්‍ය වන්නේ,
 1. නාට්‍යයේ රචකයාටය
 2. නළු නිළියන්ටය
 3. ප්‍රේක්ෂකයන්ටය
 4. මතක් කර දෙන්නාටය

අංක 06 සිට 10 දක්වා හිස්තැනට සුදුසු පිළිතුර යොදන්න

06. නාට්‍ය පුහුණුව සංවිධානය කිරීම සඳහා නායකත්වය ගන්නා පුද්ගලයා .........................................නමින් හඳුන්වයි

07. ශිථිලකරණය මගින් නළුවාගේ ශරීරය ..................................................... වේ.

08. හුස්ම ගැනීම සහ පිට කිරීමේ අභ්‍යාස මගින් ................................................ අභිනය දියුණු කර ගත හැකිය.

09. චුල්ල ධනුද්ධර ජාතකය පදනම් කරගෙන නිර්මාණය කළ සුප්‍රකට නාට්‍යය ................................................ වේ.

10. වේෂ භූෂණ යනු නළු නිළියන් භාවිත කරන ........................................................... වේ.

11 සිට 15 දක්වා ඇති ප්‍රකාශ හරි නම් ✓ ද වැරදි නම් ✗ ද ඉදිරියෙන් ලියන්න.

11. රංග අභ්‍යාස ප්‍රගුණ කිරීමෙන් රඟපෑම දියුණු කර ගත හැකිය ( )

12. රඟපෑමේදී මනස සම්බන්ධ නොවී ශාරීරික ක්‍රියාවන් සිදු කළ හැකිය ( )

13. නරිබෑණා නාට්‍යය නිර්මාණය කලේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාය ( )

14. චරිතවල ප්‍රතිවිරෝධී අදහස් මතුවීම නාට්‍යයක ගලායාමට බාධකයක් විය හැකිය ( )

15. නළුවාගේ බාහිර සමාරෝපය සඳහා වේෂ භූෂණ විශාල බලපෑමක් කරයි ( )

16 සිට 20 දක්වා අ කොටසට වඩාත්ම ගැලපෙන පිළිතුර ආ කොටසින් තෝරන්න.

| | අ | "ආ" |
|---|---|---|
| 16. | මාෂා හා වළහා | පාලිත ලොකු පෝතාගම |
| 17. | නාට්‍යෝපකරණ | වාචික අභිනය |
| 18. | නාට්‍ය ගීත | මුනිදාස කුමාරතුංග |
| 19. | අමර ගියා දිව්‍යලෝකේ | ආහාර්ය අභිනය |
| 20. | හීන් සැරය | ඩී කුමාරගේ |

## II කොටස

ප්‍රශ්න අංක 01 ඇතුළු තවත් ප්‍රශ්න දෙකක් අතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන සංවාදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| වලහා | කවුද මේ |
| මාෂා | මට මේ මූකලානේ පාර වැරදිලා පාර හොයාගන්න මෙහෙම ආවේ |
| වලහා | බොරු කියන්න එපා (බයෙන්) මායාකාර කෙල්ලක් ,මායාකාර හඬක් , මොකද එහෙම කෑ ගැහුවේ |
| මාෂා | වලස් රාළහාමී මගේ අත පෑගුවා ඒකයි කෑ ගැහුවේ |
| වලහා | (කල්පනා කරයි) මායාකාරියක් නොවෙයිද? මට හරියට දැනගන්න ඕනා බය වෙන්න නරකයි යන්න ඕන ළඟට |

1. මෙම සංවාද ඛණ්ඩය උපුටා ගන්නා ලද්දේ කුමන නාට්‍යයකින් ද? (02)
2. වළහා පැමිණෙන්නට පෙර මාෂා වලහාගේ නිවසට පැමිණ කලේ කුමක්ද? (02)
3. මාෂා වලහා ගේ නිවසට පැමිණියේ ඇයි (02)
4. සංවාද ඛණ්ඩය කියවා එහි ඇති රංග විධාන දෙකක් ලියා දක්වන්න. (02)
5. ඉහත නාට්‍යයේ අවසානයේදී සම්බන්ධ වන ප්‍රධාන චරිතයේ නම ලියා දක්වන්න (02)

02. 1. ආනුෂංගික අංග යනු කුමක්ද? හඳුන්වන්න. (04)

2. ආනුෂංගික අංග 4ක් නම් කර කෙටි විස්තරයක් ලියන්න. (06)

03. 1. අභිනය යනු කුමක්ද? (04)

2. අභිනය නම්කර කෙටියෙන් විස්තර කරන්න (06)

04. 1. නළුවරණය යනු කුමක්ද? (03)

2. ඔබ නිර්මාණය කරන නාට්‍යයේ සඳහා ඉහත කාර්ය ඉටු කරන ආකාරය සටහන් කරන්න. (07)

05. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

1. රංග වස්ත්‍ර 2. නාට්‍යයේ ගැටුම

3. භූමිකා 4. නාට්‍ය පෙළ රචනය (5x2- 10)